## 460 වන්දනීය වූ

වන්දනීය වූ පූජනීය වූ
ජුසේවාස් ධම්ම දූත පූදැදුරාණනේ
ධීර වීර වූ ඔබේ
දහම් සේවයේ අනුහසින්
මෙ ලක්බිම අපේ එළිය වේ

විපත් වලේ වැටී පෙළී සිටියවුන් සොයා
එදා ගියේ ඔබයි පියේ නොබා රෑ දිවා
දහම් සිසිල පොවා ඔවුන් පවස නිවා
නවෝදයක් උදා කලේ මහා පිනක් ලබා //

කැලෑ මැදින් දෙපා වැරෙන් ගියේ දුර ගමන්
දුගී වෙසින් සැදී ගතින් දරා දැඩි ගමන්
කුසට අහර පවා නැතිවැ දවස ගෙවා
එදා දෙසූ දහම් අමා රසේ බසී ගලා //

මිනිස් සිතුම් පැතුම් ලොවී සැපට නැඹුරු වී
මිලේ නිලේ බලේ කෙරේ සිටින වහල් වී
දනන් කෙලෙස් නසා දෙලෝ සැපත් දිනා
දෙවන් වරම් කිතුන් දහම් රකින්න පෙම් පුදා //